**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය**

**----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්වාගණනය කළ විගණන මතය**

**---------------------------------------**

ආරක්ෂක අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශය මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(අ) ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අත්පත් කරගෙන තිබුණු වටිනාකම රු.මිලියන 3,400.75 ක් වූ මූලධන වත්කම් ඒසීඒ 6 ආකෘතියේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ඒසීඒ 6 ආකෘතිය අනුව තොරතුරු ඉදිරිපත් කල යුතුය. | ස්ථාවර වත්කම් තිබූ අගයන් සියල්ලම සිගාස් ගිණුම් වැඩසටහනින් ඉවත් කර 2018 දෙසැම්බර් 31 දිනට පවතින වත්කම් සියල්ල නැවත ඇතුලත් කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් දෙන ලද බැවින් සියළුම අගයන් 2018 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂයන් යටතේ වාර්තා කරන ලදී. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2018 වර්ෂයේ රු.මිලියන 22.60 ක්වූ පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි ආදායම් ඇස්තමේන්තු පුරෝකතන වල සංෂිප්ත ආදායම ලෙස දක්වා තිබුණද එක් එක් ප්‍රභවයන් යටතේ ඇස්තමේන්තු ගත ආදායම සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ආදායම් ඇස්තමේන්තු වල නිවරදි තාවය පිලිබඳ පරීක්ෂා කල නොහැකි විය. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ 2002 ජූලි 17 දිනැති අංක 2002/01 චක්‍රලේඛය ප්‍රකාරව පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි ආදායම් ගිණුමට අදාලව ආදායම් පුරෝකතන හා ඇස්තමේන්තු පිලියෙල කල යුතුය. | සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය මගින් ඉදිරියේදී විස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතුවේ. |
| (ii) එක්සත්ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි තුලින් සමාලෝචිත වර්ෂය සඳහා | | එක්සත් ජාතින්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරි තුලින් ලද ආදායම පිළිබඳ |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා යුධ හමුදාව මගින් රු.මිලියන 684.31 ක් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් රු.මිලියන 1,833.98 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,518.29 ක් වූ ආදායමක් ගිණුම්ගතකර තිබුණි. මෙ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ. | | විස්තර යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාව වෙතින් ලබා ගෙන ඉදිරිපත් කර ඇත. |
| - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයවිය යුතු රු.මිලියන 726.61 ක හිග ආදායම මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ-1(i) හිග ආදායම් පිළිබද ප්‍රකාශයේ පෙන්නුම් කර නොතිබුණි. තවද එම හිග ආදායම තුල මාලි රාජ්‍යයේ සාමසාධක මෙහෙයුම් වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 593.37 ක හිග ආදායමක් ඇතුලත් විය. | ආදායම් ඇස්තමේන්තු සංශෝධන හා හිග ආදායම් වාර්තා පරීක්ෂාව සඳහා විගණනයට ඉදිරිපත් කල යුතුය. තවද හිග ආදායම් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| - | මාලි රාජ්‍යයේ සාමසාධක මෙහෙයුම් රාජකාරි සඳහා වූ අවබෝධතා ගිවිසුම් පිළියෙල කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුලදීද අවසන්වී නොතිබුණි. | මාලි රාජ්‍ය තුල සාමසාධක මෙහෙයුම් රාජකාරි 2017 දෙසැම්බර් 24 දින සිට ආරම්භ කර ඇති බැවින් ඒ සඳහා වූ අවබෝධතා ගිවිසුම් පිළියෙල කිරීමේ කටයුතු කඩිනමින් නිමකල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (iii) | අමාත්‍යංශයේ අංශ කිහිපයක් 2019 ජනවාරි මාසයේ සිට පෞද්ගලික අංශයට අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කිරිම සඳහා කුලී අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.මිලියන 20.19 ක් 2016 අගොස්තු 03 දිනැති අංක 250/2016/(I) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ගිණුම් ක්‍රමයට පටහැනිව වැය විෂය අංක 103-01-02-13-1508 යටතේ ගිණුම් ගතකර තිබුණි. | අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් 2016 අගොස්තු 03 දිනැති අංක 250/2016/(I) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ගිණුම් තැබිය යුතුය. | 250/2016/(**I**) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව නිවැරදිව ඉදිරියේදී සටහන් කිරීමට කටයුතු කෙරේ. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අමාත්‍යංශයෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 62 දෙදෙනෙකු ගෙන්, මියගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් හා වැඩ තහනම් කල නිලධාරීන් 03 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු අත්තිකාරම් මුදල රු.මිලියන 4.44 ක් විය. ඒ අතුරින් රු.මිලියන 2.88 ක ණය ශේෂ වර්ෂ 05 කට වඩා හිගව පැවැතුණි. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය පරිදි හිග හිටි අත්තිකාරම් අයකරගැනීමට කටයුතු කල යුතුය. | 2019 අප්‍රේල් මස 30 දින වන විට මෙම ණය ශේෂයන්ගෙන් රු.මිලියන 1.45 ක් අයකරගෙන ඇත. ඉතිරි ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**(ඇ) තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | අමාත්‍යංශයේ පොදු තැන්පත් ගිණුම් දෙකක තැන්පතු ලෙජරයේ දැක්වෙන ශේෂය හා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු ශේෂය අතර රු.මිලියන 6.05 වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂ සැසඳීම් කර නිවැරදි ශේෂයන් ඉදිරිපත් කල යුතුය. | පොදු තැන්පත් ගිණුමේ පවතින වෙනස සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වා ඇත. |
| (ii) | අමාත්‍යංශය විසින් ඉදිරිපත් කරන ලද පොදු තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වසර 2 ක ඉක්මවූ රු.මිලියන 158.50 ක තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. ඉදිකිරීම් අවසන්වූ කොන්ත්‍රාතුවල රැදවුම් මුදල් සම්බන්ධයෙන් අදාල අංශ වෙතින් විමසීම් කර තවදුරටත් තබා ගැනීමට, අයකර ගැනීමට හෝ නිදහස් | අංක 002/0115 හා අංක 0016/063 තැන්පත් ගිණුම් වල වසර 02 ඉක්මවූ තැන්පතු ගෙවීමට කටයුතු කෙරෙමින් පවතී. යුධ හමුදා මූලස්ථාන ඉදි කිරීම් ව්‍යාපෘතිය මෙතෙක් අවසන් වී නොමැති බැවින් රු.මිලියන 154.92 ක රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී ඇත. |

කිරිමට කටයුතු කල යුතුය.

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

--------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2017 වර්ෂය අවසානයට පැවැති ජංගම නොවන වත්කම් වල වටිනාකම රු.මිලියන 23,032.59 ක් වුවද 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබද වාර්තාව අනුව එම වටිනාකම රු.මිලියන 6,076.73 ක් වූයෙන් රු.මිලියන 16,955.85 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද අමාත්‍යංශයට අයත් සියළුම ඉඩම් හා ගොඩනැඟිලි හදුනා ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ අවසානයට පවතින ජංගම නොවන වත්කම්වල නිවැරදි වටිනාකම දැක්විය යුතුය. අමාත්‍යංශයේ සියලු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර හදුනාගෙන ලේඛනගත කල යුතුය. | හැකි ඉක්මනින් මෙම ස්ථාවර වත්කම් සියල්ල සිගාස් වැඩසටහනට ඇතුලත් කරනු ලැබේ. ඉදිරියේදී සියළුම ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණය කිරීම සඳහා කටයුතු සකස් කර ඇත. |
| (ii) ස්ථාවර වත්කම් යටතේ වූ ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකම රු.මිලියන 568.99 ක් වුවද අමාත්‍යංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනවල එම අගය රු.මිලියන 5.67 ක් විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගය හා උපලේඛනයෙහි අගය සමාන විය යුතුය. | රු.මිලියන 563.32 ක් වූ සුහුරුපාය ගොඩනැගිල්ලෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනය වන විට සිගාස් වැඩසටහනට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. |
| (iii) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල යුතුව පැවැති අමාත්‍යංශයේ වත්කම් සම්බන්ධ වාර්තාව යවා තිබුනේ 2019 මැයි 24 වන දින දීය. | 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | වාර්තාවේ මෘදු පිටපතක් 2018 සැප්තැම්බර් 25 වන දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු හා ඉතිරි මාස 03 ට අදාල ඇතැම් යාවත්කාලීන කරන ලද වත්කම් ලේඛනය 2019 මැයි 24 වන දින යවන ලදි. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) <u>ඇප ලේඛනය</u><br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii) <u>හානි පිළිබඳ ලේඛනය</u><br>ත්‍රිවිධ හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

**(ඊ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අක්මුදල් ගිණුමේ ශේෂයක් නොමැති වුවද අක් මුදල් ගැලපුම් ගිණුමට අනුව රු.මිලියන 4,936.10 ක ශේෂයක් විය. එම වටිනාකම් වලට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුම පිළියල කල යුතුය. | අක්මුදල් ගැලපුම් ගිණුමේ ගණිතමය දෝෂයක් පවත්නා බවට නිරීක්ෂණය වේ. එය නිවැරදි කර අක්මුදල් ගැලපුම් ගිණුම ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. |
| (ii) අමාත්‍යාංශය සතු බැංකු ගිණුම් අංක 00070401910 ට අදාලව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ 395 පරිදි මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. | බැංකු සැසඳුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. |

(ඇ) **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළයුතු සහතික වීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ ඒ(VI) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (iii) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ | අදහස් දක්වා නොමැත. |

| | |
|---|---|
| තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිලිතුරු ලබාදීමේදී ප්‍රමාදයන් සිදුවී තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. මිලියන | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (i) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | | අමාත්‍යාශය විසින් වාර්ෂික මුල්‍ය ප්‍රකාශ සමග වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වුවද එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය පරිදි කටයුතු කල යුතුය. | 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව මේ වන විට මුද්‍රණ කටයුතු සඳහා ලබාදී ඇති අතර එය ඉදිරියේ දී පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ. |
| (ii) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 261/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.2 ඡේදය | 2.99 | ගණන්දිමේ නිලධාරියෙකු විසින්ම හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතු අතර හිඟ ආදායම් තවදුරටත් එකතු විම වැලැක්විම සඳහා නිසි අවධානයක් යොමු කල යුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ පුපුරණ ද්‍රව්‍ය හා ගිණි අවි බලපත්‍ර හිඟ ආදායම රු.මිලියන 2.99 වූ අතර එයින් වර්ෂ දෙකකට වැඩි හිග ආදායම රු.මිලියන 2.26 ක් විය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී මෙය අයකර ගැනීමට සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, පොලිස් අධිකාරිවරුන්, ගිනිඅවි බලපත්‍රලාභීන් දැනුවත් කිරිම. ගිනිඅවි හිමිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබාදීම<br><br>බලපත්‍ර ගාස්තු සමඟ දඩමුදල් අයකිරිමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කිරීම. ක්‍රමවේදයක් යෝජනා කර ඇත. |
| (iii) | 2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඑෆ්ඩී/04/08/01/59 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය අනුව පොදු ගාස්තු අය කිරීම සංශෝධනය කිරීම සඳහා ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලානුරූපීව සංශෝධනය කල යුතු බව දක්වා තිබුණු නමුත් 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධිත) පනත යටතේ අයකරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂ 18 ක් තුලදී කිසිදු සංශෝධනයක් සිදුවී නොතිබුණි. | ගාස්තු සංශෝධනය සඳහා 2015 දෙසැම්බර් 11 දිනති අංක පීඑෆ්ඩී /04/08/01/59 දරන චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. | ගිනිඅවි බලපත්‍ර සම්බන්ධ ගාස්තු සංශෝධනය කිරීම පාර්ලිමේන්තුවේ පනත් සංශෝධන කෙටුම්පතකින් පමණක් සිදුකළ හැකි බව නීතිපති විසින් 2019 පෙබරවාරි 05 දිනැති E/28/2019 ලිපිය මඟින් දන්වා ඇත. |
| (iv) | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යයසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද 2019 මැයි 31 දින දක්වාත් සභාගතකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. | අමාත්‍යාංශ විෂය පථයට ආයතන එකතු වීම 2019 අප්‍රේල් 21 හදිසි තත්ත්වය ප්‍රමාදයට බලපාන ලදි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 ආදායම් කළමනාකරණය**

-----------------------------

ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය ආදායම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් අයකර ගැනීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිසි වැඩ පිළිවෙලක් යටතේ වියදම් කළ යුතු වුවත් මූලධන වැය විෂයයන් 25 කට අදාලව රු.මිලියන 1,664.19 ක් සහ පුනරාවර්ථන වැය විෂයයන් 31 කට අදාලව රු.මිලියන 51.86 ක් ඉතිරිවීම් පවතින බවත් එම ඉතිරිවීම් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 11 ත් සියයට 98 ත් අතර පරාසයක පැවති බවත් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කල යුතු අතර වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම්, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම්, අවශ්‍යතාවයන් පැන නොනැගීම, ප්‍රතිපාදන පසුව අනුමත වීම, බිල්පත් ලැබීමේ ප්‍රමාදයන් ආදී හේතුවෙන් ප්‍රතිපාදන ඌන උපයෝජනයට බලපා තිබුණි. අවසථා 19 කදී වියදම් කලමනාකරණය කරගෙන ඇත. |
| **(ii)** | අත්‍යවශ්‍ය බව හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යනාදී කරුණු දක්වමින් මුදල් රෙගුලාසි 66 යටතේ ඉල්ලුම්පත් 18 ක් මගින් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද ඉන් රු.මිලියන 48.44 ක් සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන මාරු කිරීමේදී නිසි කළමනාකරණයකින් සිදුකල යුතුය. | මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් වර්ෂය අවසාන කාර්තුවේදී අනුමත වීම නිසාත් නිසි කලට බිල්පත් නොලැබීම, අක්මුදල් නොලැබීම, 2018 වර්ෂය අවසාන කාලසීමාවේ රටේ පැවති දේශපාලන ව්‍යාකූලභාවයන් නිසා අපේක්ෂා කල පරිදි කටයුතු කල නොහැකි විය. |
| **(iii)** | මුදල් රෙගුලාසි 66 පරිදි ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් අනතුරුවද වැය විෂයන් 19 ක | මුදල් රෙගුලාසි 66 පරිදි මාරුකල ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුය. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 1,150.97 ක ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණු බව නිරීක්ෂණය විය. | | |
| **(iv)** | සලසාදී තිබුණු සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම වෙනත් වැය විෂයකට මාරු කර තිබුණු අවස්ථා 09 ක් නිරීක්ෂණය විය. | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතු අතර ලබාදී තිබූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුය, වියදම් පැනනැගේවියැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන ඉල්ලුම් නොකල යුතුය. | ආරක්ෂක අමාත්‍යවරයා, ජනාධිපතිතුමා වන බැවින් ඊට අදාල වියදම් ජනාධිපති කාර්යාලයේ වැය විෂය යටතේ දරන අතර වියදම් බලාපොරොත්තුවෙන් ප්‍රතිපාදන රදවා ගෙන පසුව වෙනත් වැය විෂයන්ට මාරු කරන ලදී. |
| **(v)** | මුදල් රෙගුලාසි 230 ප්‍රකාරව සංකේත ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව පුනරාවර්ථන වැය විෂයකට හා ප්‍රාග්ධන වැය විෂයන් 5 කට නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම හා අතිරේක ප්‍රතිපාදන මඟින් රු.මිලියන 57.93 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල ඉන් උපයෝජනය කර තිබුනේ රු.මිලියන 6.57 ක මුදලක් පමණි. | මුදල් රෙගුලාසි 230 ප්‍රකාරව සංකේත ප්‍රතිපාදන සලසා ගතයුතුය. නව ව්‍යාපෘති විධිමත් පරිදි අනුමත කරවා ගෙන ප්‍රතිපාදන සලසාගෙන වියදම් දැරිය යුතුය. | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා ගන්නා අවස්ථාවේදී සඳහන් කර ඇති වැය විෂයන් යටතේ වියදම් අපේක්ෂා නොකල අතර වර්ෂය අතර මැදදී එම වැය විෂයයන්හි අවශ්‍යතා පැන නැගීම නිසා මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන ලබා ගැනීමට සිදුවිය. |
| **(vi)** | ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පුනාරාවර්තන වියදම් සඳහා රු.මිලියන 15 ක හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 4 ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේ වියදම පිළිවෙලින් රු.මිලියන 7.25 ක් හා රු.මිලියන 1.52 ක් විය. ඒ අනුව ඉතිරිවීම් පිළිවෙලින් සියයට 52 ක් හා සියයට 62 ක් වීමෙන් උපයෝජනය පහල මට්ටමක පැවැතුණි. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු අතර වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිපාදන උපයෝජන කළ යුතුය. | ආයතන වෙනුවෙන් ඉල්ලුම් කල අදාල භාණ්ඩ හා සේවාවන් ට අදාල මුදල් අනුමැති හා අදාල ගෙවීම් නිසිපරිදි සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ඉතිරිවී තිබුණු ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයයන් දෙකක එකතුව රු.මිලියන 12.51 ක තවදුරටත් බැරකම් වලට බැඳී තිබුණි. තවද ත්‍රිවිධ හමුදා මූලස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ එකතුව රු.මිලියන 39.71 ක් වූ බැරකම් අවසන් ගිණුමෙන් හෙළිදරව් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට අනුව ඉතිරිවී තිබුණු ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතිකර නොගත යුතුය. තවද සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතුය. | සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේ අක් මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා අපේක්ෂිත පරිදි කටයුතු කිරීමට නොහැකි විය. ත්‍රිවිධ හමුදා මුලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාලව එළඹෙන ලද බැරකම් කොටසක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මගහැරී ඇති අතර, මින් ඉදිරියට නිවැරදිව සටහන් කල යුතු බවට විෂය භාර නිළධාරීන් දැනුවත් කර ඇත. |
| (ii) | ජාතික ශිෂ්‍යභට බළකාය, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ඇතුළු ආයතන 5 ක් සඳහා ගිවිසුම් ගත ඉදිකිරීම්, සැපයුම්, සේවා කොන්ත්‍රාත් සම්බන්ධ බැදිම් පිළිබඳ විස්තර බැදිම් යටතේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති සියලු කොන්ත්‍රාත්තු ගත බැදීම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කලයුතු අතර එවැනි බැදීම් නොමැති නම් ඒ බව සඳහන් කල යුතුය. | බැඳීම් ලේඛනය තුල අමාත්‍යාංශය යටතේ ඇති විගණනය විසින් පෙන්වා දී ඇති ආයතන 05 සඳහා ගිවිසුම්ගත ඉදිකිරීම්, සැපයුම්, සේවා කොන්ත්‍රාත් සම්බන්ධ බැඳීම් පිළිබඳ විස්තර නියමිත දිනට ඉදිරිපත්කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

ජාතික ශිෂ්‍යභට බලකාය හා පර්යේෂණ හා සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් වලට අදාලව කාර්යසාධන දර්ශකයන් දක්වා නොතිබුණි. වාණිජ කාර්යයන් සඳහා පුපුරණ ද්‍රව්‍ය භාවිතයේදී සුරක්ෂිත බව තහවුරු කිරීම, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත සංශෝධනය, ස්වයං ආරක්ෂක සේවා පවත්වාගෙන යනු ලබන ආයතන නියාමනය කිරීමට අවශ්‍ය අණපනත් සංශෝධනය කිරීමේ කටයුතු සහ එහි කාර්යසාධන මැනීමේ දර්ශක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) දිස්ත්‍රික් සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක කාර්යාලවල පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත පාලනයක් ඇතිකල හැකිවන පරිදි පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම් තොරතුරු/ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාම සිදු නොවන බව දිස්ත්‍රික් කාර්යාල තුනක සෝදිසි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද සිවිල් ආරක්ෂක අංශයේ යාවත්කාලීන පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. | පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත පාලනයක් ඇතිකල හැකිවන පරිදි තීරණ ගැනීමට අදාල තොරතුරු/ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාම හා දත්ත පරිගණක ගත කිරීම සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii) 2018 වර්ෂයේදී කුරුණෑගල හා පුත්තලම් දිස්ත්‍රික්කවල ගල් වැඩපොලවල් සම්බන්ධයෙන් සිදුකල විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම ප්‍රදේශයේ බලපත්‍ර ලබා නොගෙන අනවසරයෙන් පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරමින් ගල් වැඩපොලවල් 35 ක් පවත්වාගෙන යන බවට හඳුනාගෙන තිබුණද, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඉටු කල යුතුය. 2005 අංක 18 දරන පුපුරන ද්‍රව්‍ය (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය | නීති විරෝධී ලෙස පවත්වා ගෙන යනු ලබන ගල් වලවල් 38 ක් පිළිබඳ ක්‍රියාමාර්ග ගන්නා ලෙස පුත්තලම දිස්ත්‍රික් ලේකම් හා පොලිස් අධිකාරී වෙත දන්වා ඇත. |
| (iii) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත ජාතික විගණන කාර්යාලයේ විශේෂ විමර්ශණ හා වෝහාරික විගණන අංශය විසින් සිදුකල විගණනය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කළුගල් කැඩීම සඳහා ඩයිනමයිට්, වෝටර් ජෙල් වලට | 2005 අංක 18 දරන පුපුරන ද්‍රව්‍ය (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය.<br>අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම යටතේ වූ පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීමේ දී සුරක්ෂිත | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | අමතරව ගල් වෙඩි බෙහෙත් හා ඇමෝනියා නයිට්රේට් භාවිතා කරන බව දැනුම්දී තිබියදීත් එය නොසලකා කටයුතු කර තිබුණි. එසේම පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කල යුතු පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය තීරණය කිරීමේදී මාසික උපරිම ධාරිතාවය සැලකිල්ලට ගෙන නොතිබීම ආදී නිරීක්ෂණ සඳහා අමාත්‍යාංශය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඉටුකලයුතුය. | |
| (iv) | ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තුමේන්තුව විසින් බාහිර පාර්ශවයන් වෙත සේවා සැපයීමෙන් උපයනු ලබන ආදායම්, ඒ සඳහා දරනු ලබන වියදම් හා ඒකාබද්ධ අරමුදලට කරනු ලබන බැර කිරීම් සම්බන්ධව අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදාව අතර එකඟතාවයෙන් යුත් විධිමත් ක්‍රමවේදයක් 2018 දෙසැම්බර් 31 දක්වාත් සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2016 ඔක්තොබර් 26 පැවැති විගණන හා කළමනාකරණ රැස්වීමේදී එළැඹි තීරණයන්ට අනුව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

**-----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | --------------- | ---------------------------------------- |
| (i) | මහල් 20 කින් යුත් පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පෞද්ගලික බැංකු 02 ක් හා රාජ්‍ය බැංකු 02 ක් මඟින් අමාත්‍යාංශය විසින් රු.මිලියන 7,550 ක ණයක් ලබාගෙන තිබුණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය | 2017 ජුනි 28 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය. | සුහුරුපාය ගොඩනැගිලි පරිශ්‍රය ඉදිකර අවසන් වූ පසු එවකට ගත් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ස්ථාපිත කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | දක්වා ඉදිකිරීම් සිදුකල වසර 03 තුල ප්‍රාග්ධනිත කල පොළිය රු.මිලියන 1,272 සහ ලබාගත් ණය මුදල වූ රු.මිලියන 7,512 සමග මුලු ණය මුදල රු.මිලියන 8,784 ක් විය. 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි ණය ශේෂය රු.මිලියන 6,827 ක් විය. කෙසේ වෙතත් ගොඩනැගිල්ලේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම වත්කම් ලේඛනයට ඇතුලත් කිරීම සඳහා කටයුතුකර නොතිබුණි. ණය මුදල රජයේ ණය ලේඛනයට ඇතුලත් කිරිමට 2017 මාර්තු 28 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණද ඉදිකිරීම් කාලය තුල ප්‍රාග්ධනිත කල පොලිය වූ රු.මිලියන 1,272 ගැලපීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොතිබුණි. | | |
| (ii) | ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සහ පොලීසියේ සන්නිවේදන අවශ්‍යතා සපුරාලන උපාය මාර්ගික සන්නිවේදන සඳහා පොදු හඬ සහ දත්ත මූල ආධාරක ජාල ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණු නමුත් ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් සම්පූර්ණකර නොතිබුණි. සම්බන්ධතා 37 කින් සමන්විත ජාල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වූ ශුද්‍රතරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධති සපයා ස්ථාපනය කිරීමේ කටයුතු සඳහා රු.මිලියන 574.9 ක් ඇස්තමේන්තු කර තිබුණු | ව්‍යාපෘති ඒකකය විසින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් කල කාලය තුල ව්‍යාපෘති කටයුතු නිම කිරීමටත් ප්‍රතිපාදන උපයොජනයටත් කටයුතු කල යුතුය. | විවිධ ආයතන වලින් අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්, අයහපත් කාළගුණික තත්වය, ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩර් කැඳවීම් ප්‍රමාද විය.<br>නව ආරක්ෂක මූලස්ථානය - අකුරේගොඩ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නිම කර නොමැති හෙයින්, මෙම ජාල ව්‍යාපෘතිය එම මූලස්ථානයට සම්බන්ධ කිරීමේ කටයුතු සමථයකට පත්කිරීමට නොහැකි වී ඇත. |

නමුත් ඒ සඳහා ලංසු කැඳවීමට කටයුතු කර නොතිබුණි. තවද ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 22 ක් ඉදිකිරීමේ කටයුතු අතුරින් කුලුණු 11 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එම කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. සංනිවේදන කුළුණු ඉදිකිරීම හා මයික්‍රෝ තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එම කාර්ය සඳහා 2016 හා 2017 වර්ෂයන් තුල රු.මිලියන 34.50 ක් වැය කර මිලදීගෙනතිබූ විදුලි ජනක යන්ත්‍ර 22 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් යෝජිත අරමුණින් බැහැරව නිෂ්ක්‍රියව පැවතුණි.

**3.4 ප්‍රසම්පාදනයන්**

**---------------**

**ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය**

**----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2014 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබූ ත්‍රිවිධ හමුදා මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතුවල සමස්ථ ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දිනට සියයට 51.3 ක් විය. ඒහි අදියර 1 යටතේ අත්‍යාවශ්‍ය කොටස් වූ සන්නිවේදන, ආරක්ෂක ගොඩනැගිලි ඉදිකිරීම, මළ ප්‍රවාහන හා ජල පද්ධතියේ | උපදේශක ආයතනයේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හා අමාත්‍යංශය විසින් සැලසුම් කල පරිදි ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු නිමකිරීමට හැකිවන පරිදි ප්‍රතිපාදන උපයෝජනයට කටයුතු කල යුතුය. | 2015 වර්ෂයේදී ව්‍යාපෘති සමාලෝචනයට පත්කල අමාත්‍ය මණ්ඩල කමිටු වාර්තාව දිගු කාලයක් ප්‍රමාදවීම, ඉන් පසු කාල සීමාව තුල ව්‍යාපෘතියේ කටයුතු ඉතා මන්දගාමීව සිදුවීම, හා ඊට සමගාමීව අනෙකුත් ඉදිකිරීම් කටයුතු අඩාල වීම ආදී හේතු මත 2015-2017 වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝජනය අඩු වීමට බලපා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 61, සියයට 58 හා සියයට 20 ක පහල මට්ටමක පැවතුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 3920.25 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල මුදල රු මිලියන 2,957.94 ක් පමණක් විය. තවද ව්‍යපෘතිය සඳහා දරන ලද සමස්ත වියදම රු.මිලියන 21,961 ක් වූ අතර එය මුලු ව්‍යපෘති ඇස්තමේන්තු පිරිවැය සම සැසඳීමේදී සියයට 39.46 ක් විය. එසේම ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුව අවස්ථා 3කදී සංශෝධනය කර තිබුණි. | | |
| **(ii)** | සමාලෝචිත වර්ෂයට සිවිල් කොන්ත්‍රාත් කාර්යයන්, වාස්තුවිද්‍යා හා ඉංජිනේරු උපදේශක සේවා ඇතුලත් කොන්ත්‍රාත් 119 ක් සඳහා රු.මිලියන 14,242 ක් ඇස්තමේන්තු කලද අනුමත වී තිබුණු ප්‍රතිපාදන රු.මිලියන 4,000 ක් වීමෙන් රු.මිලියන 10,242 ක ප්‍රතිපාදන ඌණතාවය මත ප්‍රසම්පාදන සැලසුම් සංශෝධනය කර තිබුණි. නැවතත් අවසාන කාර්තුවට බලපාන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම රු. මිලියන 12,137 ක් ලෙස සංශෝධනය කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කල හැකි කාර්ය භාර්ය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල යුතුය. | 2018 වසරේ අග භාගයේදී නිම කිරීමේ අරමුණින් මුළු පිරිවැය රු.මිලියන 14,242 ක් සඳහා වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුම පිළියෙළ කරන ලදි. අනුමත ප්‍රතිපාදන රු.මිලියන 4,000 ක් වුවද රු මිලියන 617 ක බිල්පත් පියවීම සඳහා ද්‍රවශීල මුදල් ප්‍රමාණවත්ව නොලැබුණි. |
| (ii) | ආරක්ෂක සේවා විද්‍යාලය ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම. | | |
| | (i) 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ආරක්ෂක සේවා | ක්‍රියාකාරී සැලසුම් ප්‍රකාරව ව්‍යාපෘති අරමුණ වූ දුර බැහැර ප්‍රදේශ වලින් | ඉංජිනේරු ඇස්තමේන්තු හා පිරිවිතර සකස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු නිම කිරීමට |

| | | |
|---|---|---|
| විද්‍යාලයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලට අදාලව සැපයුම් කොන්ත්‍රාත් කාර්යයන් 46 ක් සැලසුම්කර තිබුණද සැලසුම් කල ප්‍රසම්පාදන කාර්යයන්ගෙන් රු.මිලියන 123.94 කට ඇස්තමේන්තුකල කාර්යයන් 22 ක් 2018 නොවැම්බර් දක්වාත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2018 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර තිබුණු එකතුව රු.මිලියන 54.59 ක් වූ සැපයුම් කොන්ත්‍රාත් කාර්යයන් 24 ක් සැලසුම් කල නියමිත කාලයට වඩා දින 53 සිට දින 287 දක්වා පරාසයක ප්‍රමාදවීම් නිරීක්ෂණය විය. | පැමිනෙන සිසුන් 554 දෙනකු හට නේවාසික පහසුකම් ලබාදීමේ කාර්යය ඉටුවෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු නියමිත දිනයන්ට නිමකළ යුතුය. | නොහැකි විය. |
| (ii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර තිබුණු රු.මිලියන 66.76 ක් වූ කාර්යයන් 22 ක් සදහා කොන්ත්‍රාත් ගිවිසුම් ලියා අත්සන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) පරිදි කොන්ත්‍රාත් ගිවිසුම් ලියා අත්සන් කල යුතුය. | 2019 වර්ෂයේ සිට නිසි පරිදි ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2019 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද ආරක්ෂක අමාත්‍යාංශයේ අංශ 66 ක සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 07 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 හා 3.2.6 ඡේදවල දැක්වෙන කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය කර ඒ අනුව වාර්තා වන ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් කටයුතු නිම කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ මුදල් සම්බන්ධව සහ ගබඩා භාරව කටයුතු කරන නිළධාරීන් විසින් 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට හා මුදල් රෙගුලාසි 880 අනුකූලව ඇප තැබිය යුතු වුවද අමාත්‍යාංශයේ එම නිලධාරීන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඇප තබා නොතිබුණි. | 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට හා මුදල් රෙගුලාසි 880 අනුකූලව ඇප තැබිය යුතුය. | අමාත්‍යාංශයේ විෂය පථය හා ගලපා ගනිමින් සිටින අතර අමාත්‍යාංශ යටතේ ආයතනය දැනුවත් කර ඇත. |

**4. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිය ආයතනයට අදාලව අරමුණු ඉලක්ක සඳහා වන පරතරයන් හඳුනා ගැනීම මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් සකස් කල කලයුතු වේ. මේ සම්බන්ධව | 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිය ආයතනයට අදාලව අරමුණු ඉලක්ක සඳහා වන පරතරයන් හදුනා ගැනීම මෙන්ම | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය දැනුවත් වී තිබුණද ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළගා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ඉලක්ක වෙත ලගාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් සකස් කල කලයුතු වේ. | |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී විගණන පරීක්ෂණ 16ක් හා විමර්ෂණ 1 ක් ක්‍රියාත්මක කර එහි වාර්තා අදාල අංශ/ආයතන වෙත යොමුකර තිබුණද ඉන් 12 ක් සඳහා 2019 මැයි 31 දින දක්වාත් පිලිතුරු සපයා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 77 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සංඛ්‍යාව** | **සේවකතථ්‍ය සංඛ්‍යාව** | **සේවකපුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 64 | 51 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 09 | 06 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 239 | 185 | 54 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 136 | 129 | 7 |
| | **එකතුව** | **448** | **371** | **77** |

(ආ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව යුධ හමුදාව වෙතින් කම්කරු සේවකයින් 35 දෙනකු ද, නිලධාරීන් 102 දෙනෙකු සෙසු නිල සාමාජිකයන් 449 දෙනෙකු අමාත්‍යාංශ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි. | රාජකාරී කටයුතුවලට අදාල වගකීම් නිසි පරිදි පැවැරිය හැකිවන පරිදි විධිමත්ව තනතුරු ඇතිකිරීමටත් පත්වීම් ලබාදීමටත් කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii) | ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සමග අධ්‍යක්ෂ තනතුරු 3 ක්,පර්යේෂණ විශ්ලේෂක තනතුරු 1 ක් හා පර්යේෂණ සහකාර තනතුරු 4 ක් පිරවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණද බඳවාගැනීම් සඳහා වසර 2 ½ කට ආසන්න කාලයක් ප්‍රමාදවී තිබුණු බව නිරීක්ෂණය විය. තාවකාලික පදනම මත බඳවාගත් කාර්යමණ්ඩලය සඳහා මාස 06 කට වරක් අවස්ථා 4 කදී සේවය දීර්ඝ කරමින් වැටුප් ගෙවමින් පැවතුණි. | - එම - | අදහස් දක්වා නොමැත. |
| (iii) | නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරක හා අතිරේක නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරු 02 ක පුරප්පාඩු පැවතුණි. තවද තම නිත්‍ය රාජකාරී දිස්ත්‍රික්කයට අතිරේකව දිස්ත්‍රික්ක 03 ක වැඩ බැලීමට සහකාර පුපුරණ ද්‍රව්‍ය නිලධාරියෙකුද, තම නිත්‍ය රාජකාරී දිස්ත්‍රික්කයට අතිරේකව දිස්ත්‍රික්කයක | - එම - | අදහස් දක්වා නොමැත. |

වැඩ බැලීමට සහකාර පුරාවිද්‍යා නිලධාරීන් 05 දෙනෙකුද පත් කර තිබුණි.